මාගේ කර්ම විපාක

ජයසිරි විජේරත්න
හිඹුටාන
071-1514498
jt4s7vj@gmail.com
www.qsl.net/4s7vj

<u>හැඳින්වීම</u>

මාගේ ජීවිතයේ අමතක නොවන රසමුසු තැන් අළලා මවිසින් ලියනලද ‘‘මට මතකයි මට මතකයි පුංචි කාලෙ මං’’ සහ ‘‘ජීවිතයක අත්දැකීම්’’ යන කෘතීන්ගෙන් උපුටාගත් සුවිශේෂී සිද්ධීන් සහ වෙනත් සමහර අත්දැකීම් විග්‍රහ කිරීම සඳහා, බෞද්ධ දර්ශනයේ විස්තරවන හේතුඵලදහම සහ කර්මවිපාක හැර අන් කිසිම මගක් ඇති බවක් මට නම් නොහැඟේ.

ජයසිරි විජේරත්න

2020 අප්‍රියෙල් 14

චේතනා හං භික්ඛවේ කම්මං වදාමි!

පටුන

පිටු අංකය

3 - නාඳුනන කාන්තාව දුන් ටොපිය, මාව පැහැරගෙන යාමට උත්සාහ කිරීම, ජීවිතයක් බේරාගැනීම-1
4 - ජීවිතයක් බේරාගැනීම -2, ජීවිතයක් බේරාගැනීම-3, බඹා කෙටූහැටි
5- හමුදා-සිසු ගැටුම, ප්‍රථම රිය අනතුර
6- මරණය පෙනි පෙනී බලා සිටීම
7- නයිජීරියාවේදී සිදුවූ රිය අනතුර
8 - අනතුරක් නොවී අනූනමයෙන් බේරීම
9- අබලන් පාලම
10- නයිජීරියාවේ සිට හදිසියේ ආපසු පැමිණීම
11- නයෙක් පෑගීම,
12 - සර්පයෙකුගෙන් ගැලවීම, අසරන මගියෙකුට පිහිටවීම, මෝටර් බයිසිකලය මෝටර් රථයක ගැටීම, ජීවිතයක් බේරා ගැණීම,
13 - ජීවිත දෙකක් බේරා ගැණීම, අනිසි ලෙස කලබල වීම,
14 - මාර්ග අනතුරකින් ගැලවීම,
15 - තැඹිලි ගහෙන් වැටීම, අනූනමයෙන් බේරීම (ජංගම දුරකථනය), සන වන පියසක අතරමංවූ නව අත්දැකීමක්,
16 - මා කොකළ වරදක් නිසා සිදුවූ වැරදීම
17- ප්‍රබලතම කර්ම විපාකය
18- අනූනමයෙන් බේරීමේ පාපකර්මය, අනූනමයයි දශම නමයයි නමයෙන් බේරීම
19 - හෘද ස්පන්ධනය වැඩිවීම, සුනඛයින් සම්බන්ධ කර්ම,

<u>නාඳුනන කාන්තාව දුන් ටොපිය</u>

වර්ෂ 1955 දී පමණ (වයස අවුරුදු 11ක්) දිනක් මා පාසැල් ගොස් එන අතර බස්රියේදී මාළඟ වාඩිවී සිටි කාන්තාවක් තම අත්බෑගය විවෘත කර ටොපි දෙකක් ගෙන ඉන් එකක් කටේ දමාගෙන අනෙක මට දුනි. මම එය අතට ගෙන ඇය අහක බලනවිටම පිටතට වීසි කළෙමි.

මෙය ඉතා සරල සිද්ධියක් වුවද බුදුදහම අනුව එය මෙසේ විග්‍රහ කළහැකිය. මාගේ යම් පාපකර්මයක් හේතුකොටගෙන මට ඇයව හමුවිය. ඒ සමගම මතුවූ යම් පුන්‍ය කර්මයක් ඉස්මතුවීම නිසා මාව ඇගේ ග්‍රහණයට නතුකර ගැනීමට නොහැකි විය. එකල ළමයින් පැහැරගෙන ගොස් කරවල වාඩිවල සේවයට යෙදවීම සිදුවෙමින් පැවතුනි.

<u>මාව පැහැරගෙන යාමට උත්සාහ කිරීම</u>

මගේ වයස අවුරුදු 11 – 12 පමණ වූ අවදියේ දිනක් පාසැල් ගොස් එන අතර පිටකොටුවේදී නාඳුනන මිනිසෙක් මා සමග ඉතා ඕනෑකමින් කතාවට වැටී, තේ බීම සඳහා වීර හෝටලයට හෝ ඒ අසලම පිහිටි වෙනත් එකකට මාව අඬගහගෙන යනලදී. මා රවටාගෙන පැහැරගෙන යාමට තැත් කරන්නේදැයි සැක සිතුන බැවින් ඒ බව අඟවන්නේ නැතිව කල්පනාවෙන් සිටියෙමි. මා මේසයක් අසල වාඩිවී සිටියදී ඔහු ඇතුලට ගියේය. සුදුසු අවස්ථාව ලත් විගස, මම හිමින් සීරුවේ නැගිට පිටතට පැමිණ දුවන්නට වූයෙමි. නතර වූයේ අංගොඩ බසයට ගොඩවීමෙනි.

මෙහි සඳහන් පුද්ගලයා පෙර භවයක මාගේ පරම හතුරෙකි. මට ඔහුව මුණගැසුනේ මාගේ යම් පාපකර්මයක් ඉස්මතුවීම හේතුකොටගෙනය. නමුත් ඒසමගම ඉස්මතුවූ මාගේ යම් පුන්‍යකර්මයක විපාකය ලෙස මට ඔහුගෙන් මිදී පලායාමට අවස්ථාව සැලසුනි. එකල මන්නාරම ප්‍රදේශයේ දූපත්වල කරවල වාඩිවල වැඩට පිරිමි ළමුන් පැහැරගෙන යාමේ මාෆියාවක් තිබුනි.

<u>ජීවිතයක් බේරාගැනීම-1</u>

වර්ෂ 1955-60 කාලයේ, ගංවතුර ගලාගෙන එන දිනක, උදේ සිට ඔරු පදිමින් ගංවතුරට කොටුවී සිටින අයට එගොඩ මෙගොඩ වීමට උදවු කර, ගොම්මන් වෙලාවේ අපේ වත්ත ළඟටම පැමිණිවිට ඈතින් ඇසෙන හඬක් වෙත මගේ අවධානය යොමුවිය. අමාරුවෙන් හුස්ම ගන්නා හඬක් බව මට වැටහුනි. එය ඇසුනේ මීටර 150 ක් පමණ ඈතින්ය. මා තනිවම ඒ දෙසට ඔරුව පැදවූවිට දක්නට ලැබුනේ බංඩියගොඩැල්ලට උඩහ බඩවැටියක කටුකම්බි වැටේ කරපටිය පටලැවී මරුවිකල්ලෙන් දඟලන එළදෙනකි. ඒ වනවිටත් වතුරෙන් උඩට තිබුනේ උගේ හිස පමණි. ගංවතුර ගලාගෙන එන බැවින් ජල මට්ටම ක්‍රමයෙන් වැඩිවෙමින් පැවතුනි. උදවුවට අහල පහළ කිසිවෙක් නැත. කිසිවෙක් සොයාගැණීමට තරම් වෙලාවක්ද නැත. කම්බිය කැපීමට අඬුවක්ද නැත. අඳුර වැටීගෙන එනබැවින් ඉක්මන් කළයුතුය. මා ප්‍රශ්ණ ජාලයකට මැදිවුවත්, උත්සාහය අත්හලේ නැත. මා වහා ක්‍රියාතමකවීමි. සැහෙන වෙහෙසක් දරා, ටික වේලාවකින් පැටලුම් හැර ඒ අහිංසක සතාගේ ජීවිතය ගැලවූයෙමි. ගොඩට පැන දුවගෙන යන ඌ දෙස මා බලා සිටියේ නිම්හිම් නැති සතුටකිනි. ගෙදර පැමිණි වහාම දෙමව්පියන්ද සමගද එම සතුට

බේදාගතිමි. ගෙදර එනවිට, "අඳුර වැටිලත් පොඩිපුතා තවම නැත්තේ මොකදැ" යි තාත්තා වත්ත පහළටවී බලා සිටියේය.

මෙම එළදෙනගේ කිසියම් පාප කර්ම විපාකයක් අනුව දියේ ගිලී අවසන් ගමන් යාමට වැඩකටයුතු සැලසුනඅතර වෙනත් පුණ්‍ය කර්මවිපාකයක්ද ඉස්මතුවී මාව ඒ දෙසට යොමුවිය. ඒ සමගම මාගේ පෙර පුණ්‍ය කර්මයක් ඉස්මතුවීම හේතුකොටගෙන මට තවත් පිනක් කරගැනීමට අවස්ථාවක් උදාවිය.

ජීවිතයක් බේරාගැනීම-2

දිනක් (1965-70 කාලයේ) මා අංගොඩදී බස්රියක පාපුවරුවේ පහළම පඩියෙහි සිටිනවිට මට ඉහළ පඩියෙහි සිටි කෙනෙක් (මැදිවියේ පිරිමි කෙනෙක්) මගේ ඇඟට බරවූ බැවින් ඔහු වැටෙන්න යනබව අවබෝධ කරගත් මා සැණෙකින් ඔහුව අල්ලාගතිමි. බස්රියද සැලකියයුතු වේගයකින් ධාවනය විය. මා කෑගසමින් "මෙයා වැටෙන්න යනව, ඇතුලට ගන්න අසනීපයක් වගෙයි" යයි කීවිට අනෙක් මගීන්ද සහායවී ඇතුලට ගන්නාලදී. ඔහුට මීමැස්මොරය වැනි අසනීපයක් වැළඳී තිබුනි. මා එහි නොසිටින්න එය ඔහුගේ අවසානයවනු නියතය.

මෙම පුද්ගලයාගේ යම් පාපකර්මයක් ඉස්මතුවන මොහොතක වෙනත් පුණ්‍ය කර්මයක්ද ඉස්මතුවී මා එතැනට ළංවීම නිසා එය වැළකුනි. ඒ සමගම මගේ පුණ්‍ය ශක්තිය අනුව මට තවත් පිනක් කරගැනීමට අවස්ථාව උදා විය.

ජීවිතයක් බේරාගැනීම-3

වර්ෂ 1965 දී මා පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයට ඇතුලත්ව පළමුවසර ගතකළේ විජේවර්ධන ශාලාවේය (කාමර අංක 303). දිනක් මා යම් අවශ්‍යතාවයකට ඉදිරිපස කාමරයට ගිය සැනෙකින් දුටුවේ අදහාගත නොහැකි දර්ශනයකි. එහිවිසූ දිසානායක, ඔහුගේ රූම්මේට්ගේ (ධර්මදාස) මේසය අසල ඇති විදුලි පේනුවට (plug base) මුත්‍රා කිරීමට සැරසෙන අයුරු දුටු මම වහා ක්‍රියාත්මක වී ඔහුව පසෙකට තල්ලු කරමින් "යකෝ තෝ මැරෙන්නද හදන්නෙ" යනුවෙන් පවසා එහි බරපතලකම පැහැදිලි කර දුනිමි. මා හමු නූනා නම් එක්කෝ ඔහුගේ ජීවිතය තත්පර ගණනකින් අහිමිවන්නට තිබුනි, නැත්නම් ජීවිත කාලයටම ආබාධිතයෙක් වන්නට ඉඩ තිබුනි.

ඔහුගේ පෙර කරනලද පාපකර්මයක් විපාක දීමට මොහොතකට පෙර වෙනත් පුන්‍ය කර්මයක් ඉස්මතුවී මාව එතැනට යොමුවිය. ඒ හැර මාගේ පෙර පුන්‍ය ශක්තියක් හේතුකොටගෙන මට තවත් පිනක් කර ගැණීමට අවස්ථාව උදා විය.

බඹා කෙටුහැටි

පේරාදෙණිය සරසවියේ අවසාන වසරේ පළමු වාරයේ ගාන්ධර්ව සංගමය මගින් සංවිධානය කරනලද ලෝකාන්ත චාරිකාවට මමද සහභාගි වූයෙමි. 1967 නොවැම්බර් 9 වැනි දින පාන්දරින්ම බස්රථ කීපයකින් පේරාදෙනියෙන් පිටත්වූ අප ලෝකාන්තයට පිවිසෙන මහමග අවසන්වූ තැනට යනවිට දහවල්වී තිබුනි. සංවිධායකයින් දිවා ආහාර පාර්සල් සහිත පෙට්ටිය පිටතට ගෙන, තුරුසෙවනෙහි තැබූ අතර, කවුරු කවුරුත් පෝලිමක් සෑදී, එක එක රැගෙන තණ බිස්සෙහි වාඩිවී ආහාර ගන්නා ලදී. මා සාමාන්‍යයන් පෝලිම්වල සිටීමට අකමැතිය. එබැවින් සුපුරුදු පරිදි

කලබලකාරයින්ට ඉඩදී පෝලිමේ අවසානයට එක්වූයෙමි. මා ඉදිරියෙන් සිටියේ ගැහැනු ළමයෙකි. ඈ මාදෙස බලා ''හානේ ඔයා ගත්තෙ නැද්ද, මේ අන්තිම එකනෙ මං ගත්තෙ, කමක් නෑ අපි මේක බෙදාගෙන කමු'' යයි කී බැවින් අප දෙදෙනාද පැත්තකින් වාඩිවී හවුලේ එක බත්පත අනුභව කළෙමු. එතැන් පටන් අද දක්වාම අප දෙදෙනා හවුලේ දුක-සැප බෙදාගතිමු.

මා විශ්වාස කරන්නේ මෙය අහඹු සිදුවීමක් නොවන බවයි. පෙර සංසාරයේ භව ගණනාවකදී අප දෙදෙන එක්ව වාසයකර ඇත. එම සසර පුරුද්දට මෙලෙස හදිසියේ හමුවන්නට ඇත.

හමුදා-සිසු ගැටුම

1969 පෙබරවාරි 2 වැනිදා උදේ මා ගෙදර සිට පේරාදෙණියට ගියේ එදින විජේවර්ධන ශාලාවේ නවාතැන් ගෙන, පසුදින මගේ පෙම්වතිය වූ කුසුම්ව හමුවීම සඳහාය. ගලහ හන්දියේ සිට විජේවර්ධන ශාලාවට සාමාන්‍යයෙන් පයින් යන මා කිසිම හේතුවක් නැතිව, පේරාදෙණිය-ගලහ හන්දියේ බස් නැවතුම්පොලෙහි නතරවිය. එහි සිටියේ එක් මැදිවියේ කාන්තාවක් පමණි. ඇය කීප වරක්ම මා දෙස ඉතා ඕනෑකමින්ම බලනබව දුටු මම ඈ දෙස බලත්ම, මහත්තය කොහාට යන්නද ඉන්නෙ......ඇයි දන්නෙ නැද්ද මෙහෙ කලබල ගැන..... මෙතන ඉන්න එක බොහොම අන්තරාදායකයි ...... ඉක්මනට මෙතනින් යන්න. පාර දිගේ යන්න එහෙම එපා .... යනුවෙන් මට උපදෙස් දුනි. මම මේ කොළඹ ඉඳලයි ආවෙ. යයි පවසා වහාම එතනින් පිටවී බැංකුව පිටුපස පාර දිගේ විජේවර්ධන ශාලාවට, එහි පිටුපස දෙසින් ගියෙමි. තත්වයේ බරපතලකම අවබෝධ වූයේ එවිටය. සරසවි භූමියේ ලැගුම්ගෙන සිටි හමුදා භටයින් සහ සරසවි සිසුන් අතර ගැටුමක් නිසා සරසවිය වහාම වසා ඇති අතර, හමුදා භටයින් රැගත් ට්‍රක්රථ රාශියක් නික්මයන අයුරු දක්නට ලැබුනි. හමුදා භටයින් ට්‍රක් රථ වලින් යන ගමන්ම ශිෂ්‍ය නේවාසිකාගාර වෙත ගල්-මුල් වලින් පහරදෙන ආකාරයත් නේවාසිකාගාරතුල සිටින සිසුන්ද එම ට්‍රක්රථ වලට ප්‍රතිප්‍රහාර එල්ලකරන ආකාරයත් දක්නට ලැබුනි.

මෙහිදී මා එම බස් නැවතුමෙහි නතරවූයේත්, එම කාන්තාව හමුවූයේත් මගේ පෙර පිනකටය. එම කාන්තාව හමු නොවූයේ නම් එය මගේ අවසානය වනු ඒකාන්තයි. මා එම බස් නැවතුම්පොලෙහි නතරවූයේ ඇයිද යනු අදටත් ප්‍රෙහේලිකාවකි. කර්මය හැර එය විස්තර කළහැකි අන් කිසිවක් නැත.

ප්‍රථම රිය අනතුර

වර්ෂ 1970 නොවැම්බර් 17 වැනිදා සවස 2:15 ට පමණ අවිස්සාවේල්ල පාරේ කොළඹ දෙසට ස්කූටරය පදවමින් සිටියෙමි. පාර කාපට් කර තිබූ නිසා ඉතා හොඳ තත්වයේ පැවතුනි. පැයට කිලෝමීටර 60 ක පමණ වේගයකින් අඹගහ හන්දියට ළඟාවනවිට ඉදිරියෙන් පැමිණි මොරිස්මයිනර් වර්ගයේ කළු පැහැති මෝටර්රථය කිසිම සංඥාවක් නොමැතිව පාරේ අනිත් පැත්තට ගත් බැවින් මා සිතුවේ, එහි ඇති (මගේ වම් පැත්තේ) අතුරු පාරට හරවනු ඇත යනුයි. මම වහාම වේගය අඩුකරමින් දකුණට ගත්තෙමි. සැනෙකින් එම රථය ආපසු මගේ දකුණු පැත්තට මදක් හැරවූයෙන් මම වමට ගත් නමුත් අනතුර වැළැක්විය නොහැකි බව මට

අවබෝධවිය. ඊළඟ මොහොතේදී මෝටර්රථයේ ඉදිරිපස ගැටුන මා මෝටර් රථයට උඩින් වීසිවී වටයක් කරකැවී රථයට පිටුපසින් බිම වැටුනේ කකුල්දෙකින් සිටගත් අයුරුය.



එකෙනෙහිම අසල සිටි කෙනෙක් මගේ අව් කන්නාඩි කුට්ටම ගෙනත් දුන් අතර තවත් කෙනෙක් මගේ රියැදුරු බලපත්‍ර පොත ගෙනත් දෙමින් "බුදුඅම්මෝ මහත්තයො මම නම් හිතුවෙ මහත්තයගෙ කැලි අහුලන්න වෙයි කියලයි, ටිකක් අතපතගාල බලන්න කොහෙද තුවාලවෙලා තියන්නෙ කියල" යයි කීවේය. මා එවිට පරීක්ෂා කළවිට පෙනී ගියේ දකුණු කකුලේ දණහිසට පහළින් ඇති සුළු සීරිමක් හැර වෙනත් කිසිදු තුවාලයක් නැති බවය. මා පසුව මෝටර්රථයතුල (2ශ්‍රී2871) බියෙන් තැතිගෙන සිටි රියැදුරු මහතාගෙන් "මොකදවුනේ" යයි ඇසුවෙමි. එවිට ඔහු "අනේ මහත්තය මං දැක්කෙ නෑ මෝටර්බයිසිකලයක් එනබව, පාරෙ බලුකුණක් තිබුන, ඒකයි මම දකුණට කැපුවෙ" යනුවෙන් කීවේය. පසුව රථය ඉදිරියට ගොස් බැලූවිට, මා දුටුවේ එහි බොනට් එකමැද ඇති සුදුයකඩ "එම්" අකුරට අඟල් හතරක් පමණ දකුණට වන්නට මගේ හිස වැදුන තැන හිසේ වක්‍රතාවයටම රවුමට වලක්මෙන් ඇතුලට එබී ඇති ආකාරයයි. ඉහතකී එම් අකුරෙහි වැදුනේ නම් මා මොහොතක්වත් ජීවත් නොවනු ඒකාන්තයි. එකළ අප රටෙහි මෝටර්බයිසිකල්කරුවන් අතර හිස්වැසුම් (හෙල්මට්) පැළඳීමේ සිරිතක් හෝ නීතියක් නොතිබුනි.

මෙම මාරක අනතුරින් ගැලවුනේ කෙසේද යන්න, කර්මය හැර වෙනත් කිසිම අයුරකින් පැහැදිලි කළ නොහැකිය. මාගේ පෙරභවයකවූ පාපකර්මයක් හේතුකොටගෙන එතැන බලු කුණක් තිබීමත්, මෝටර් රථයක පැමිණීමත් සිදුවිය. නමුත් වඩාත් ප්‍රබල පුණ්‍ය ශක්තිය හේතුකොටගෙන, මාගේ හිස ගැටුන තැන අඟල් හතරකින් වෙනස්වීම නිසා ජීවිතය ගැලවුනා පමණක් නොව කිසිම තුවාලයක් සිදු නොවීය. සිද්ධිය ඇසින් දුටුවන් කෙතරම් බියට පත්වූවත් මාගේ කිසිම චකිතයක්වත් නොවීය.

<u>මරණය පෙන පෙනී බලා සිටීම</u>

වර්ෂ 1979 දී වෛද්‍ය ජයන්ත නානායක්කාර (4S7DJ) මහතාට ආධුනික ගුවන්විදුලි සම්ප්‍රේශණය සඳහා ඇන්ටෙනාවක් සාදාදීමට දින කීපයක්ම ඇතුල්කෝට්ටේ ඔහුගේ නිවසට ගියෙමි. ඇළුමිනියම් බටයක සිදුරක් විදීම සඳහා විදුලි බුරුමය (electric drill) අතටගෙන, දකුණු

දණහිස සහ වම් පතුල බිමට සිටින අයුරු (පාවහන් නැතිව) තණකොළ සහිත මිදුලෙහි සිටිමින්, එය ඉහලට ඔසවා, සුවිචය ඇඟිල්ලෙන් තද කළෙමි. පෙරදින පලංචියක් උඩ සිට වැඩකරනවිට සුළු විදුලි කාන්දුවක් තිබූ බව මට මතක්වූවද, ඒවනවිට සුවිචය ඔබා තිබුනෙන් මට ඉතා ප්‍රබල ලෙස විදුලිසැර වදින්නට විය. මුළු සිරුරම අඛන්ඩ ලෙස ප්‍රබල දෙදරීමකට ලක්වී ඇතිබව හැඟුනි. ඔබපු ඇඟිල්ල බුරුල් කිරීමටවත්, ඩ්‍රිල්එක සහිත අත පහත දැමීමටවත් නොහැකි අතර, මුළු සිරුරම අක්‍රිය වී ඇති නමුත් හොඳ සිහි කල්පනාවක් තිබුනි. මා ඉදිරියෙහි සිටි අත්උදව්කරු වූ අතුල (ජයන්තගෙ සේවකයෙක්) මගෙ මූණ දෙස බලා සිටින නමුත් කිසිවක් නොකරන බැවින් තත්පර දහයක් පමණ ගතවූ පසු මා මෙසේ සිතන්නටවිය. ''මේ මනුස්සයට තේරෙන්නෙ නෑ මට කරන්ට් වදින බව'', තවත් තත්පර 10 ක් පමණ ගතවූ පසු ''මූ නම් හරිම මෝඩයෙක්, තව මිනිත්තුවකින් මාව මැරෙණ එක ස්ථිරයි'' යනුවෙන් සිතන අතර මාව වැටෙන්නට යන බවක් මට තේරුනි. එවිට මා කල්පනා කළේ ''මාව වැටුනොත් නම් බේරෙන්න ඉඩ තියනව'' යනුවෙනි. ඒ සමගම මාව බිමට පෙරලුන අතර විදුලිය විසන්ධි විය. මා සැනෙකින් ඩ්‍රිල්එක අතහැර, වහා නැගිට අතපය දිගහැර නවා, හිසද ඒමේ අත හරවා බැලුවෙමි. කිසිම අසාමාන්‍යතාවයක් නැති බව අවබෝධ විය. ඊළඟට අතුලට කතාකර ''ඇයි ඕයි ඔය ප්ලග් එක ගැලෙවුවෙ නැත්තේ මට කරන්ට් වදිනබව තේරුනේ නැද්ද'' යයි කීවිට, ''අනේ සර් මං මේ බලාහිටියෙ ඩ්‍රිල් එක හෝ ගාල වැඩ කරද්දි විදින්නෙ නැතුව මගෙ මූන දිහා බලා ඉන්නෙ මොකද කියලයි.'' පසුව මා දුටුවේ ගෙදර ට්‍රිප් සුවිච්එක නිවී ඇති බවයි. නමුත් එම පැරණි වර්ගය, යම් කෙනෙකුට විදුලි සැර වැදීමේදී ක්‍රියාත්මක නොවන බව මම හොඳාකාරව දන්නා බැවින්, තවදුරටත් පරීක්ෂා කළෙමි. එහි ප්ලග් එකේ අර්ත් වයරය ගැලවී තිබුන බව දුටුවෙමි. ඒ අනුව මා නිගමණය කළේ, මාව බිම පෙරලෙනවිට සක්‍රිය අග්‍රය (live terminal) සහ භූගත අග්‍රය (earth terminal) එකට ගෑවීමෙන් ට්‍රිප් සුවිචය ඕෆ් වූ බවයි.

කිසිවිටකත් ලැබිය නොහැකි අත්දැකීමක් ලැබීම ගැන මම සතුටු වූයෙමි. මෙයින් ඉගෙනගත් වැදගත් පාඩම් දෙකකි. පළමුවැන්න නම්, කුමන ආකාරයේ වැඩක් කළත්, මෝඩයින් ළංකර නොගතයුතු බවයි. (''අසේවනාච බාලානං පන්ඩිතානන්ච සේවනා'' යන බුදු වදන සිහියට නැගුනි.) දෙවැන්න නම්, විදුලිසැර වැදීමේ අවදානමක් ඇත්නම් සැපපහසු ස්ථාවර ඉරියවුවක සිටීම නොකළයුතු බවයි. මාව බිම පෙරලුනේ අස්ථාවර අයුරු දනබිම ඇනගෙන සිටි නිසාය. යම් ලෙසකින් සැපපහසු ලෙස පුටුවක වාඩි වී සිටියානම් එය මගේ අවසානය වනු නියතය.

මෙවැනි අනතුරක් සිදුවී, කිසිම අසාමාන්‍යතාවයක් නොමැතිව ගැලවුන කෙනෙක් සොයාගැණීම ඉතා අපහසුය. එපමණක් නොව එවැනි අනතුරකින් දිවි ගැලවුන කෙනෙක් සොයාගැණීම ඊටත් වඩා අපහසුය. මෙහිදී මාගේ යම් පූර්ව පාප කර්මයක් හේතුකොටගෙන විදුලිසැර වැදුනත්, අනතුරක් සිදුනොවී ආරක්ෂාව සැලසුනේ යම් පුණ්‍ය ශක්තියක් හේතුකොටගෙන බව මාගේ විශ්වාසයයි. තත්පර ගණනක් විදුලිසැර වැදීම නිසා අභිමිවූ ජීවිත පිළිබඳ ප්‍රවෘත්ති මා කොතෙකුත් අසා ඇත.

<u>නයජීරියාවේදී වූ රිය අනතුර</u>

මා නයිජීරියාවේ සිටියදී පාවිච්චි කළේ අළුතින්ම ගන්නාලද ෆොක්ස්වාගන් (1500 cc) මෝටර් රථයකි. 1981 දී දිනක් හිතවතෙක් වූ ධර්මරාජාගේ පවුලේ අය රැගෙන ඒම සඳහා තලතාමෆාරා

සිට කානෝ ජාත්‍යන්තර ගුවන් තොටුපොලට (කි.මී. 450ක්) ගොස් එන අතරමග මැලම්ෆාසිහිදී රාත්‍රි 10ට පමණ රිය අනතුරක් සිදුවිය. ඉදිරියෙන් පැමිණ පර්ජෝ (Peugeot) ස්ටේෂන් වැගන් ටැක්සි රථයක් යන්තමින් ගැටුනි. එය කෙලින්ම මා ඉදිරියට එනබව දුටු මා හැකි තරම් දකුණට හැරවූ නමුත් අනතුර වැලැක්විය නොහැකිවිය. (එම රටේ වාහන පදවන්නේ පාරේ දකුණු පැත්තෙනි) මෙවිට මගේ වේගය පැ.කි.මී. 100 – 110 පමණ වූ අතර අනෙක් වාහනය 160 ක පමණ වේගයකින් පැමිණි බව අනුමාන කළහැකිය.



මගේ රථයේ ඉදිරි වම් මඩ්ගාඩ් එකෙහි යන්තමින් ගැටී පිටුපස රෝදයේ රිම් එක ඇදවී ඇක්සලයේ ගැටීම නිසා, අනෙක් රථයේ ඉදිරි වම් ඇක්සලය කැඩී බිම වැදී පොළව හැරුන සලකුන මීටර 100 ක් පමණ දුරට ඇදී තිබුන අතර එය ආරම්භවී ඇත්තේ පාරේ මැද ඉරට මීටරයක් පමණ මගේ පැත්තට වන අයුරු බව ඉතා පැහැදිලිව පෙනෙන්නට තිබුනි.

මෙහිදී අනෙක් වාහනයේ රියැදුරාට නින්ද ගියා වියහැකිය. නමුත් එසේ වූයේ මාගේ පමණක් නොව අප හැමෝගේම පෙර පාපකර්මයක් ඉස්මතුවීමේ හේතුවෙනි. එය එසේ සිදු වූවා නම් අප සියළු දෙනාම මොහොතකින් මිය යනු ඒකාන්තයි. නමුත් එය වැලකුනේ අප සියල්ලන්ගේම සාමූහික පුණ්‍ය ශක්තියක් හේතුකොටගෙන බව මාගේ විශ්වාසයයි.

<u>අනතුරක් නොවී අනූනමයෙන් බේරීම</u>

දිනක් මා මහ මග (high way in Nigeria) තනිව, මගේ මෝටර්රථය පැ.කි.මී. 110 පමණ වේගයෙන් පදවාගෙන යනවිට හදිසියේ පිපිරුම් හඬක් නංවමින් රිය පාලනය කළනොහැකි වී අංශක 180 කින් කරකැවී ගොස් පාරමැද නතරවිය. එන්ජිමද නතර විය. සිදුවූයේ කුමක්දැයි සිතාගැණීමටවත් නොහැකි වූ අතර මම ක්ෂණිකව වාහනය පාරෙන් ඉවතට ගතිමි. එන්ජිම නතරවූ බැවින්ද නැවත පනගැන්වීමට තව තත්පර ගණනක් ගතවියහැකි බැවින්ද, ගියරයක තිබියදීම ස්ටාටරය ක්‍රියාත්මක කළෙමි. ඒ අනුව එය පාරෙන් ඉවතට ගියේ බැටරියේ බලයෙනි. මා එසේ නොකළේ නම් මහමග යන වෙනත් වාහනවල ගැටී ලොකු අනතුරක් සිදුවන්නට ඉඩ තිබුනි. පසුව පරීක්ෂා කළවිට මා දුටුවේ, ඉදිරිපස දකුණු පැත්තේ රෝදයේ ටයරය පුපුරාගොස් ඇති බවය. එම මොහෙතේ පැවති වේගය අනුව පෙරලෙන්නෙ නැතිව බේරුනේ පෙර පිනක් නිසා යයි මට සිතුනි. එම ටයරයේ, පිපිරුන තැන කැන්වස් මතුවී තිබූ බැවින් මෙය මාගේ නොසැලකිල්ල බව මට පැහැදිලි විය.

අබලන් පාලම

මා නයිජීරියාවේ විසූ සමයෙහි, දිනක් තනිවම දුර ගමණක් යනවිට මගේ මෝටර් රථය (ෆොක්ස්වොගන්-1500) ධාවනය කළේ පැ.කිමී. 100 ක පමණ වේගයකිනි. මා යන මහා මාර්ගය තරමක් උස් තැනිතලා භූමියක් වූ අතර මග දෙපස භූමිය අඩි 50 –- 100 ක් පමණ පහත් භූමියක් විය. කාන්තාර ප්‍රදේශයක් බැවින් අවට භූමිය පැහැදිලිව දර්ශණය විය. තවත් මෝටර්රථයක් පහළ භූමියේ ඉතා සෙමින් ධාවනය වන බව දක්නට ලැබුනි. නමුත් එහි මාර්ගයක් නොවූ බැවින්ද, මිනිස් වාසස්ථාන කිසිවක් එම ප්‍රදේශයේ නැති බැවින්ද, මම වේගය අඩුකර විමසිලිමත් වීමි. ඉදිරියෙහි පාලමක් ඇති බවද දක්නට ලැබුනි. අනෙක් රථයද, පාලම යට ප්‍රදේශයට ළඟා වෙමින් තිබුනි. මා පාලමට ළංවනවිට දුටුවේ ඇදහිය නොහැකි දර්ශනයකි. එනම් මා ගිය මහමග පාලමට සම්බන්ධ වන ස්ථානයේ මාර්ගය ගිලාබැස තිබුනි. පාලම සහ පාර අතර අඩි තුනක පමණ හිදැසකි. මා අනෙක් රථය නොදුටුවේ නම්, මගේ වේගය අඩු නොකරන බැවින් අනිවාර්යයෙන්ම මාරක අනතුරක් සිදුවනු නිසැකයි. (මෙහි අනතුරක් පිළිබඳව කිසිම මාර්ග සංඥාවක් නොතිබුනි) ලංකාවේ නම් මෙවැනි අවස්ථාවක කොළ-අතු ටිකක් පාරට දැමීම අපගේ සිරිතයි.

මෙය සුළුකොට තැකිය නොහැකි, ඉතාමත් බරපතල තත්වයකි. මෙවැනි මාර්ගවල ධාවනය කෙරෙන කිසිම වාහනයක් පැ.කිමී 100 ට අඩු වේගයකින් ධාවනය නොකෙරේ. (බොහෝවිට 140 – 160 වේ) මා, අනෙක් වාහනය දුටුවේ මාගේ පෙර භවයක වූ පුණ්‍ය ශක්තියක් අනුව බව ඉතා පැහැදිලිය. එසේ නූනා නම් අනිවාර්යයෙන්ම මාරක අනතුරක් සිදුවන්නට තිබුණි.



නයිජීරියාවේ සිට හදිසියේ ආපසු පැමිණීම

දිනක් (1982 ජුලි 29) ඉන්දියානු ජාතික ආනන්ද (VU2RYL) සමග මා රේඩියොවෙන් කථාකරන විට කුසුම්ගේ අසණීප තත්වය උත්සන්න බව දැනගතිමි. ඔහු කියා සිටියේ ලංකාවේ ජෝන් අමරතුංග මහතා (4S7JA)සහ තවත් කීපදෙනෙක් ඒ ගැන කථාකරනු ඔහු අසා සිටි බවත්, සංඥා දුර්වල බැවින් ඔහුට සම්බන්ධවිය නොහැකි වූ බවත්, කෙසේ හෝ මෙම පණිවිඩය මා වෙත ලබාදියයුතු බවත්, ජෝන් විසින් පවසා ඇත. මේ දිනවල සංඥා දුර්වල නිසා ලංකාවේ කිසිවෙක් සමග සම්බන්ධ වීම දුශ්කර විය. එබැවින් මට රේඩියෝවෙන් හමුවන හැමෝම සමග, **“ඉදිරි දින කීපයතුල ග්‍රී.මා.වේලාවෙන් 12:45ට මෙග හර්ට්ස් 21.200 සංඛ්‍යාතය ඔස්සේ ලංකාවේ කවුරුන් හෝ ඇමතීමට මා සූදානම්ය”** යන පණිවිඩය ප්‍රචාරය කළෙමි. එහි ප්‍රතිඵලයක් ලෙස අගෝස්තු පළමුවැනි දින (දෙදිනකට පසු) ඉහත කී වේලාවට මා විසින් ජෝන් ඇමතූ නමුත් සන්නිවේදනය කළ නොහැකි විය. නමුත් එය ශ්‍රවනය කළ නෙදර්ලන්ත ජාතික “බිල්” (PA3AWQ) ඊට ප්‍රතිචාර දක්වමින් කියා සිටියේ, 4S7JA-ජෝන්ද මෙම සංඛ්‍යාතයේ මා අමතමින් සිටින බවත් ඔහුට අප දෙදෙනාම ඉතා හොඳින් ශ්‍රවනයවන බවත්ය. ඒ අනුව ජෝන්ගේ පණිවිඩය මම “බිල්” හරහා ලබා ගතිමි. ජෝන් කීවේ, මගේ භාර්යාාගේ මානසික රෝගී තත්වය උග්‍ර අතට හැරී ඇති බැවින්, හැකි ඉක්මනින් මා ලංකාවට පැමිණියයුතු බවත් වෙනත් විකල්පයක් නැති බවත්ය.

ඒ අනුව හැකි ඉක්මනින් ලංකාව බලා පිටත්වීමට තීරණය කළ මම ඒබව ඔහුට දැන්වීමි. නමුත් මගේ හිතවතුන් ගණනාවක්ම කීවේ, විදේශ මුදල් නොමැතිව, ප්‍රවේශ පත්‍රය සනාථ කරනොගෙන ඔය ගමණ යා නොහැකි බැවින් කල්දමන ලෙසය. පසුවදාම අතින් ගෙවා, ගුවන් ටිකට්පත් ලබාගත් නමුත් ආසන වෙන්කරගැණීම සහ විදේශ මුදල් ගැණීමට සති දෙකක්වත් අවශ්‍ය බැවින් ඒවා අමතක කර ඩොලර් 15ක් පමණක් අතේ ඇතිව අගෝස්තු 5 වැනිදා ගමණ පිටත් වූයේ සම්පූර්ණ ආත්ම විශ්වාසයක් ඇතිවය. ප්‍රවේශපත්‍ර සනාථ කර (status-OK) නොමැති බැවින් ගුවන් යානයට ඇතුල්වීමේ අවසරපත (Boarding pass) නීත්‍යානුකූලව ලබාගත නොහැකිය. එබැවින් ගුවන් තොටුපලේ නිලධාරියෙකුට නයිරා 20 ක (40 US$) අල්ලසක් දී Boarding pass එක ලබා ගතිමි.

නයිජීරියාවේ අල්ලස් දීම සාමාන්‍ය දෙයකි. එසේ නොමැතිව කිසිම වැඩක් කරගත නොහැකිය. උදාහරණයක් ලෙස සාමාන්‍ය රාජකාරී ලිපියක් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විෂය භාර නිලධාරියාට භාරදෙන විට නයිරා 5 ක් පමණ ඔහුගේ ලාච්චුවට දැමිය යුතුය. එසේ නොකළහොත් එම වැඩය පසුවට කල් තබයි.

මීළඟ ප්‍රශ්ණය පැනනගින්නේ රෝමයේදී බැවින් ගුවන්යානය පිටත්වූ පසු, සම්‍යක්ප්‍රයෝගයක් කරමින් ඊට සූදානම් වූයෙමි. status-OK යනුවෙන් ටිකට්පතෙහි අලවන ස්ටිකරයක් මා ළඟ තිබුනි. කල් ඇතිවම නියමිත පරිදි අවශ්‍ය තොරතුරු(Flight number, ETD and status-OK) එහි සටහන් කරගෙන තිබූ අතර ප්‍රවේශ පත්‍රයේ නියමිත ස්ථානයේ අලවාගත් මම රෝම ගුවන් තොටුපොලේ ආසන වෙන්කරන නිලධාරිනියට ඉදිරිපත් කළෙමි. එම තොරතුරු පරිගනකයට ඇතුල් කර බලා ඇය කීවේ ආසන වෙන් නොකර බොරුවට එම ස්ටිකරය අලවා ඇති බවත්, නයිජීරියාවේ නිතරම මෙවැනි වැරදි කරන බවත්ය. පසුව පරිගනක

තිරය මා දෙසට හරවා "මේ බලන්න ඔයාගෙ ටිකට් එක සනාථ කරල තියන්නෙ වෙන දවසකටයි." යනුවෙන් කියා නයිජීරියානුන්ටම දොස් පැවරීය. ඊට හය මාසයකට පමණ පෙර, ඉදිරි දිනයක් යොදා ආසන වෙන්කිරීමට ඉල්ලුම් කළ බව මට මතක් වූයේ එවිටය. කෙසේ හෝ පැය 24ක් ඇතුලත සුදුසු ගුවන් යානයක් අසුනක් ලබාදීමට උත්සාහ කරන බවට ඇය පොරොන්දු විය. ඒ අතරතුර, මා කලින් ආධුනික ගුවන්විදුලිය ඔස්සේ සන්නිවේදනය කරන ලද ඉතාලි ජාතික "බර්නඩිනෝ" (I0ODX) වෙත දුරකථන ඇමතුමක් දුනිමි. සුළු වේලාවකින් පැමිණි ඔහු මා හමුවිය. කෙසේ හෝ හැකි ඉක්මනින් ආසනයක් වෙන්කර දෙන බවට ඔහුද පොරොන්දු විය. (ඔහු travel agent කෙනෙක් බව එහිදී දැනගතිමි)

පැය ගණනකට පසු කුසගිනි දැනුන බැවින්, නයිජීරියාවේ විසූ මා හිතවත් ද්‍රවිඩ ලාංකික පවුලක අරුල්අයියා මහත්මිය විසින් ගෙදර ගෙනයාම පිණිස සාදා දුන් කේක් ගෙඩියෙන් කෑල්ල බැගින් වරින්වර ආහාරයට ගතිමි. කෝපි කෝප්පයක් පානය කිරීම සඳහා ඩොලර් දෙකක් වැයවිය. එබැවින් ඉතිරි ඩොලර් 13 ප්‍රෙව්සමින් තබාගතිමි.

මේ අතරතුර නයිජීරියාවේ වෙසෙන මිතුරෙක් වන අනිල් රත්නායක රෝම ගුවන් තොටුපොලේදී අහම්බෙන් හමුවිය. ඔහු ලංකාවේ සිට නයිජීරියාවට යමින් සිටියේය. විස්තර කථාකළ පසු අවශ්‍ය වුනොත් වියදම් කිරීමට කියා ඩොලර් 35 ක් මට දුනි. ලංකාවට ආ විගස එය ආපසු දෙන බවට පොරොන්දු වුනත් අද වනතුරු ඔහු හමු නොවීය.

පසුව ඉහත කී නිලධාරිනිය මා වෙත පැමිණ, දින කීපයක් යනතුරු කෙලින්ම කොළඹට යා නොහැකි බැවින් බැංකොක් හරහා යාමට කැමතිදැයි මගෙන් විමසීය. මා ඊට එකඟ වූයෙන් සියළු ප්‍රශ්ණ විසඳුනි. (ඒ සඳහා කිසිම අමතර මුදලක් අවශ්‍ය නොවූයේ නයිජීරියා එයාවේස් සමාගමේ වරදින් එය සිදුවූ බව ඇයට ඒත්තු ගිය නිසාය) අධික ගමන් විඩාව නිසා ගුවන් යානය පිටත්වූ වහාම මා නින්දට වැටුනි. ආහාර ගැණීම සඳහා ගුවන් සේවිකාවක් විසින් මා අවදි කළ අතර ඉන් පසු නැවතත් නින්දට වැටුනි. කෙසේ වෙතත් පැය දහයක ගුවන් ගමණින් පැය නමයක්ම ගතකළේ නින්දේය.

මෙහිදීද කරදරයක් නොමැතිව ලංකාවට පැමිණියහැකි වීම මාගේ පුන්‍ය කර්ම විපාකයක්ය යනු මාගේ විශ්වාසයයි.

<u>නයෙක් පෑගීම</u>

1990 දශකයේ පමණ අපේ වත්තේ පිටුපස කැලෑව ඝනව වැඩී තබුණි. එහි හාවුන් කීපදෙනෙක් සහ මීමින්නක්ද විසූහ. දිනක් මා ඒ දෙසට යනවිට සර්පයෙක්ව පෑගුනි. මා සෙරෙප්පු නොපැළඳ සිටි බැවින්, ඒ සර්පයෙක් බවත්, මගේ අතේ වැලමිට අසළ ප්‍රමාණයට සමාන (විශ්කම්භය සෙමී 8 ක් පමණ) බවත් සැනෙකින් අවබෝධ වූ මම ක්ෂණිකව ඈතට පැන්නෙමි. මීටර දෙකක් පමණ දිගැති නාගයෙක් පඳුරු අතරින් ඇදීයන බව දුටුවෙමි. සෙරෙප්පු පැළඳ සිටියේනම් පතුලට එතරම් හොඳින් නොදැනෙන නිසා අනතුරක් සිදුවන්නට ඉඩ තිබුනි.

මෙහිදී මෙම නාගයාව පෑගුන බව මට ක්ෂණිකව සංවේදනය වූයේ මාගේ පෙර පුණ්‍ය කර්මයක් හේතුකොටගෙන බව මාගේ විශ්වාසයයි.

සර්පයෙකුගෙන් ගැලවීම

දිනපතාම උදෑසන පහමාරට පමණ ඉස්සරහ දොර අරින්නේ මා විසිනි. මම පුරුද්දක් වශයෙන්ම එහි උඩ අගුල අතින් අරින අතර යට අගුල අරින්නේ කකුලෙනි. දිනක් (වසර 2000දී පමණ) මම උඩ අගුල ඇරිය පසු යට අගුලද අතින්ම ඇරීම සඳහා පහත් වූවිට, එම යට අගුල අසළම බිම යමක් කළු ගුලියක් ලෙස අඩඅඳුරේ දිස්වූ බැවින් වහාම එතැන තිබෙන විදුලි පහන දැල්වූයෙමි. එවිට දුටුවේ, පොළඟෙක් හෝ කුනකටුවෙක් ගුලිගැසී සිටින ආකාරයයි. කකුලෙන් එම අගුල අරින්න උත්සාහ කළේනම් ඌ දශ්ට කිරීමට බොහෝ දුරට ඉඩතිබුනි.

මෙහිදී මා අනතුරකින් ගැලවුනේ පුරුද්දක් ලෙස කරගෙන ආ ක්‍රියාව වෙනස් වූ නිසාය. එය අහම්බෙන් සිදුවුනා යයි සිතීම අපහසුය. මගේ විශ්වාසය නම් යම් පෙර කරන ලද පුන්‍ය කර්මයක් හේතුකොටගෙන මගේ දෙනෙත් පහළට යොමුවීම නිසා සිදුවෙන්න ගිය අනතුර වැලකුන බවය.

මෝටර් බයිසිකලය මෝටර් රථයක යන්තමින් ගැටීම

වර්ෂ 1990 දී පමණ දිනක් මා මෝටර් බයිසිකලයෙන් හැව්ලොක් පාර දිගේ පැමිණ තිඹිරිගස්යාය හන්දියෙන් දකුණට හැරවූයේ තිඹිරිගස්යාය පාරටය. එවිටම තිඹිරිගස්යාය පාරෙන් පැමිණි මෝටර් රථයක් වෙනත් වාහනයනට ඉස්සර කරමින් දකුණට හැරවීය. එය මාගේ දකුණු අතේ සුළඟිල්ලේ ගැටුනි. බයිසිකලයේ ගැටුනේ නම් එය බරපතල අනතුරක්වන්නට ඉඩ තිබුනි. මම වහාම අයින් කර නවතා අධික වේදනාව සමනය වනතුරු සිට පසුව ඒ අසල පිහිටි අස්ගර්ගේ (4S6AA) නිවසට ගොස් සිද්ධාලේපය ස්වල්පයක් ආලේප කර ගතිමි.

අසරන මගියෙකුට පිහිට වීම

දිනක් (1990 දී පමණ) දෙහිවල ප්‍රදේශයේදී මම මෝටර් බයිසිකලයෙන් යන අතර යම් අවශ්‍යතාවයකට නතර කළෙමි. එහිදී තද අව්වේ ඉතා අමාරුවෙන් ඇවිදින වැදගත් පෙනුමැති වයස 60 – 70 ක පෙනුමක් ඇති මහත්මයෙක් ඉතා අසරණ ලීලාවකින් මා දෙස බැලීය. මම වහාම ඔහු ළඟට ගොස් "මහත්මයට මුකුත් ප්‍රශ්ණයක්ද, බොහොම මහන්සි පාටයි" යයි කීවිට, ඔහුගේ මුදල් නැතිවූ බවත් පිටකොටුවේ සිට පයින්ම එන බවත් කළුතරට යායුතු බවත් පැවසීය. මම වහාම ඔහුට අවශ්‍ය මුදල් දී අසල කඩයකට ගොස් අවශ්‍ය ආහාර පාන ලබාදුනිමි. විශාල පුන්‍යකර්මයක් කරගත් බව සිහි කරමින් සතුටු වූයෙමි.

මෙහිදී ඔහුගේ පෙර පාපකර්මයක් හේතුකොටගෙන මුදල් අහිමි වූ නමුත් වෙනත් පුන්‍ය කර්මයක් ඉස්මතු වීමෙන් මාව මුණගැසුන අතර, මට යම් පුණ්‍ය කර්මයක් කරගැණීමට අවස්ථාව සැලසුනේ මා විසින් පෙර භවයක කරනලද පුණ්‍ය කර්මයක ප්‍රතිඵලයක් ඵලගැනවීමක් වශයෙනි.

ජීවිතයක් බේරාගැනීම

වර්ෂ 2000/2002 දී පමණ, මා රැකියාව කරන කාලයේ ශ්‍රී ලංකා ගුවන් ගමන් පාලක සංගමය මගින් සංවිධානය කරනුලබන වාර්ෂික හමුවට මමද සහභාගි වූයෙමි. එදින අපි හික්කඩුව

ප්‍රදේශයේ සංචාරක හෝටලයකට ගියෙමු. සමහරු පිහිනුම් තටාකයේ විනෝදවන අතර මමද ඒ සඳහා සූදානම් වූයෙමි. තවත් අය ගීගයමින් විනෝද වෙමින් සිටි අතර අවුරුදු 3 – 4 ක් වයසැති කුඩා දරුවෙක් අසල තිබූ ජල තටාකයක ගැට්ට දිගේ ඇවිදින්නට වූයෙන්, මා පිහිනුම් තටාකයට නොගොස්, ඒ අසළ නතරවී බලා සිටියේ ඔහුගේ ආරක්ෂාව සඳහාය. සුළු මොහොතකින්, මා සිතූ පරිදිම, ඔහු තටාකය තුලට ඇදවැටුනි. මා වහා එතුලට පැන දිය යට ගිලී සිටි දරුවා ගොඩගතිමි. එහි අඩි තුනක් පමණ වතුර තිබුනි. පසුව අනෙක් අයද කලබලවී එතැනට පැමිණි අතර, ගී ගයමින් විනෝදවෙමින් සිටි, දරුවාගේ මවද, පියා වන ප්‍රසන්නද තම දරුවා ගැන එතරම් සැලකිලිමත් බවක් පෙනෙන්නට නොතිබුනි. ඒ පිළිබඳව ඔවුන් යුතුකමක් ලෙස ස්තුතිවන්ත වනු තියා, මා සමග එක වචනයක්වත් කතා නොකළේ, තම නොසැලකිලිමත්කම නිසා ඇතිවූ ලජ්ජාවටද, ඉන් ඇතිවූ මානසික ආතතිය නිසාදැයි මට ප්‍රහේලිකාවක් විය.
කෙසේ වෙතත් මා නොසිටින්න ජීවිතයක් අහිමි වන්නට ඉඩ තිබුනි.

මෙම දරුවාගේ යම් පූර්ව පාපකර්මයක් විපාක දෙන මොහොතේම තවත් පුන්‍ය ශක්තියක් ඉස්මතුවී මාව එතැනට යොමුවිය. ඒසමගම මගේ යම් පුන්‍ය ශක්තියක් හේතුකොටගෙන මට තවත් පිනක් කරගැනීමට අවස්ථාව උදාවිය.

<u>ජීවිත දෙකක් බේරා ගැණීම</u>

වර්ෂ 2003 දී අප පවුලේ සිවුදෙන සහ සුමුදු, (චතුරිකා දුව ඕස්ට්‍රේලියාවේ වෙසෙන බැවින් ඇය සහභාගි නොවීය) මගේ මෝටර් රථයෙන් නුවරඑළිය, බදුල්ල, බණ්ඩාරවෙල සහ ලෝකාන්තය විනෝද චාරිකාවක් ගියෙමු. අපගේ ආදර කතාවේ ආරම්භය වූ ලෝකාන්තය වෙත යාමට අමතක නොකළ අපි, උසම ස්ථානයටද ගියෙමු. එහිදී නව යොවුන්වියේ තරුණ යුවලක් මුණගැසුන අතර මගේ භාර්යාාව-කුසුම්, ඔවුන් සමග කතාවට වැටුනි. ඔවුන් එහි පැමිණියේ, දෙමවුපිය විරෝධය හේතුකොටගෙන විවාහ වීමට නොලැබෙන බැවින්, ඉන් පහළට පැන, ජීවිතයෙන් සමුගැනීමට බව දැනගත් අප නොයෙක් අවවාද උපදෙස් දී, ඔවුන්ව ආපසු කැඳවාගෙන ආවෙමු. එමගින් අපට ලැබුන පිනෙහි අග්‍ර භාගය හිමිවිය යුත්තේ කුසුම්ටය.

මෙම සිද්ධිය, කර්මඵල වශයෙන් මෙසේ විග්‍රහ කළ හැකිය. ඔවුන්ගේ යම් පාපකර්මයක් නිසා එම අදහස ඉස්මතු වූ නමුත් යම් පුන්‍ය කර්මයක් ඉස්මතු වීම හේතුකොටගෙන අප දෙදෙන හමුවිය. අපගේ යම් පුන්‍ය ශක්තියක් ඉස්මතුවී තවත් පිනක් කරගැනීමේ අවස්ථාවක් උදාවිය.

අපගේ සසර ගමනේ වර්තමානය ඉහතින් දැක්වුනද අතීතය කෙතරම් ඈතට විහිදී ඇත්ද යන්න කිවහැක්කේ පුබ්බේනිවාසානුස්මෘති ඥාණය පහළවුවහොත් පමණි.

<u>අනිසි ලෙස කලබලවීම</u>

මා සිවිල් ගුවන් සේවා පුහුණු ආයතනයේ සේවයකරන අතරතුර දිනක් පුංචිඅක්කගෙන් දුරකථන ඇමතුමක් ලැබුනි. චූටිදුව කොහෙදැයි මගෙන් විමසීය. එදින ඇය පාසැල් නොගිය බවත්, ගෙදර සිටිනබවත් මම කීවෙමි. නමුත් ඇය ගෙදර නැති බවත් පොඩි අක්කලගෙ ගෙදරද නැතිබවත්, පුංචිඅක්කා කී බැවින් කලබලවූ මා වහාම එන බව පවසා සැනෙකින් මොටර්රථයෙන් පිටත් වූයෙමි. (මේ වනවිට මට ජංගම දුරකථනයක් නොතිබුනි) කිසි දිනක

නොපැදවූ තරම් අධික වේගයකින් රිය පැදවූයෙමි. සාමාන්‍යයෙන් මිනිත්තු 45 ක් හෝ පැයක් ගතවන ගමණට සුළු වැසිදිනයක් වුවත් ගතවූයේ මිනිත්තු 22 කි. ගෙදර පැමිණිවිට කිසිම ප්‍රශ්ණයක් නැති බවත් චූටිදුව පොඩිඅක්කලගේ ගෙදර සිටි බවත් දැනගතිමි. සිදුවී ඇත්තේ එජීඅයියා විසින් කිසිම වගකීමකින් තොරව කරනලද ප්‍රකාශයක් බව මට පැහැදිලි විය. මීට පෙරද ඔහු විසින් කරනලද අණුවන ක්‍රියා මට සිහිවිය. පුංචි අක්කා මට කථාකර මිනිත්තුවකින් පමණ ආපසු කථාකර ප්‍රශ්ණයක් නැතිබව පවසා ඇත. ඒ අනුව වහා ක්‍රියා කළ රේනුකා විසින් අත්තිඩිය සම්ප්‍රේශණ මධ්‍යස්ථානයේ ගේට්ටුවේ සිටින ආරක්ෂක නිලධාරියාට, මගේ වාහනය වහාම නවත්වන ලෙස කීවිට ඔහු කියා ඇත්තේ මා අධික වේගයකින් ධාවනය කරනු දුටුබවය.

මෙහිදී සාමාන්‍යයෙන් මිනිත්තු 45 ක් ගතවන ගමණ මිනිත්තු 22 කින් නිමා කිරීම යනු අධික වේගයකින් ධාවනය කිරීමයි සමහරවිට පැයට කි.මී. 100 ක පමණ උපරිම වේගයක් තිබෙන්නට ඇත. එහි තිබූ අවදානම ගැන සිහිවූයේ පසුව කල්පනා කරන විටය.

එබැවින් කිසිම අනතුරක් නොවීම පිළිබඳව මටම පුදුම සිතුනි. ඊට හේතුව මාගේ පුන්‍ය කර්මශක්තියක් යනු මාගේ විශ්වාසයයි.

මාර්ග අනතුරකින් ගැලවීම



වර්ෂ 1990 දී පමණ මා රත්මලාන ගුවන්තොටුපොලේ ගුවන්ගමන් පාලක තනතුරෙහි රැකියාව කරනවිට නත්තල් දිනට පෙර දින අළුයම හතරට පමණ රැකියාවට යාමට සිදුවිය. මා මෝටර්බයිසිකලයෙන් බත්තරමුල්ල සිට රාජගිරිය දෙසට ප්‍රධාන මාර්ගයේ පාර්ලිමේන්තුවට හැරෙන වටරවුම (දියත උයන අසල දැන් වටරවුමක් නැත) පසුකරනවිටම හදිසියේම මා දුටුවේ පාරේ වැරදි පැත්තෙන් කෙලින්ම මා ඉදිරියට අඳුරේම එන වාහනයක් ප්‍රධාන ලාම්පු දල්වා, මට කිසිවක් හිතාගැනීමටත් පෙර ඉතා අධික වේගයකින් මගේ වම් පැත්තෙන් අඟල් හයක පමණ පරතරයක් සහිතව ගිය බවයි. මා වේගය අඩුකර පිටුපස බලනවිටත් එය පාර්ලිමේන්තු පාරට හැරී නොපෙනී ගොසින්ය. ඉහත රූපසටහනින් මෙය පැහැදිලිව දැක්වේ.

තැඹිලි ගහෙන් වැටීම

2008 වසරේ දිනක් (වයස 64 දී) තැඹිලි ගෙඩියක් කඩාගැනීම සඳහා අපේ වත්තේ ඇති අඩි 15 ක් පමණ උස තැඹිලි ගහට නැංගෙමි. දෙපයට වලල්ලක් දාගෙන නැග්ග අතර හොඳ තත්වයේ ඇතිබව පෙනුන අත්තක් වම් අතින් අල්ලාගෙන දකුණු අතින් තැඹිලි ගෙඩිය ඇද්දෙමි. තැඹිලි ගෙඩිය කැඩෙනවාත් සමගම අත්තද ගැලවුනෙන් මාව බිමට ඇද වැටුනි. මාගේ පිට කොන්ද බිම වැදුනත් වාසනාවට, මාව වැටුනේ පොල්ලෙලි ගොඩක් උඩටය. මා වහා නැගිට වටපිට බැලුවේ කවුරුත් දුටුවේද යන ලජ්ජාවටය. කිසිදු සීරීමක් පවා නොවිය. පොල්ලෙලි ගොඩ නොතිබුනිනම් බරපතල අනතුරක් වන්නට ඉඩතිබුනි. මා කුඩා කළ සිටම වත්තේ (අපේ මහ ඉඩම) තිබූ උස ගස් වලට පවා නැග තිබූ නමුත් කිසිදිනක ගහකින් වැටී නැත. එක් වරක් (වයස 12-13 කාලයේ) කජු ගහක අඩි 40-50 ක් පමණ ඉහළ සිටියදී පයගැසූ අත්ත කැඩී මාව වැටුනත් පහළ අත්තක එල්ලී බේරුනෙමි.

මෙහිදි මාගේ යම් පූර්ව පාප කර්මයක් ඉස්මතුවී පොල්අත්ත ගැලවී ගියද, වඩා බලවත් පුණ්‍ය කර්මයක් ඉදිරියට පැමිණීම හේතුවෙන් පොල්ලෙලි ගොඩ මතට මාව වැටීම නිසා අබමල් රේණුවක තරම්වත් අනතුරක් සිදු නොවීය.

අනූනමයෙන් බේරීම - ජංගම දූරකථනය

වසර 2008/09 කාලයේ දිනක් නයෝමිට (4S7NL) ආධුනිකගුවන්විදුලි සම්ප්‍රේශණය සඳහා ඇන්ටෙනාවක් සවිකරදීමට ජාලිය (4S7JL) සමග මගේ මෝටර්රථයෙන් (14ශ්‍රී710) ඇහැලියගොඩ ගියෙමි. හංවැල්ල ප්‍රදේශය හරහා මා රියපදවමින් සිටියදී ජංගම දූරකථනය නාදවිය. සාමාන්‍යයෙන් එවැනි අවස්ථාවකදී, එය සුක්කානම අසලට ගෙන පාරත් හොඳින් පෙනෙන අයුරු ඒ දෙස බලන නමුත් ඒ මොහොතේ මම හිස පහතට හරවා එදෙස බැලුවෙමි. (උදය ජයන්තගෙන් ලද ඇමතුමකි). ජාලිය ''විජේ'' යනුවෙන් කෑගසමින් සුක්කානම දකුණට කරකැවූ අතර මම ක්ෂණිකව බ්‍රේක් පැගුවෙමි. අප දෙදෙනාම ක්ෂණිකව ක්‍රියාත්මකවූ නිසා සිදුවෙන්නට ගිය මාරක අනතුර අනූනමයෙන් වැළකුනි. එසේ නොවුනා නම් දකුණටවූ වංගුව සමග තිබූ බොක්කුව උඩින් පැන ඇලට වැටෙනු ඒකාන්තයි. ජාලියට අනේක වාරයක් ස්තූති කළ මම කාලයක් යනතුරුම රියපදවනවිට දූරකථනය නිවාදමන්නට පුරුදු වූයෙමි. ජාලිය නයෝමිට පැවසුවේ, තව ඩිංගෙන් රේඩියෝ සංගමයට **''අපගේ බලවත් ශෝකය''** සහිත බැනර් දෙකක් හදන්න සිද්ධවෙන බවයි.

මෙහිදී මා දෙනෙත් පහතට යොමු කළේ මාගේ පෙර පාප කර්මයක් ඉස්මතු වූ නිසාය. නමුත් වඩා ප්‍රබල පුණ්‍ය කර්මයක් බලවත් වීම හේතුකොටගෙන භයානක අනතුරක් වැලකුනි.

සන වනපියසක අතරමංවූ නව අත්දැකීමක්

ගාල්ල ප්‍රදේශයේ හියාරේ වනපියස අක්කර 600 ක පමණවූ ස්වභාවික වනාන්තරයකි. එහි කෙළවරක පිහිටි වනජීවී සංගමයට අයත් නිල නිවස තුල තෙදිනක් ගත කළ මම තවත් හත්දෙනෙක් (කුලසේකර-4S7KG, සිරිමාන්න-4S7DSB, මහින්ද අබේවර්ධන-4S7PA, සිරිමෙවන් අබේසිංහ-4S7SA, ජර්මන් ජාතික පීටර්-DC0KK/4S7KKG, කිංස්ලි විමලවංශ සහ මග පෙන්වන්නා) සමග 2016 දෙසැම්බර් 12 වැනිදා දහවල් 11 ට පමණ සන වනය තුලට පිවිසියෙමි. අප

සියල්ලෝම හියාරේ වැව අසල ඇති අඩිපාර දිගේ කිලෝමීටරයක් පමණ ගමන්කරන අතරතුර එහිවූ කන්ද නැගීමට මා යෝජනා කළත් කිසිවෙකුගෙන් ඊට ධනාත්මක ප්‍රතිචාරයක් නොලැබින. එබැවින් ටිකදුරක් ඉහළට නැගීමට මම අදහස් කළෙමි. ජලාශය පෙනි පෙනී තනිවම වනය තුලට පිවිසුන අතර හදිසියේම රුස්ස ගසක අමු අත්තක් මට අඩි කීපයක් ඉදිරියේ කඩා වැටුනෙන් මා තිගැස්සුනි. මා සිතුවේ වඳුරන් හෝ රිලවුන් ඇති බවයි. නමුත් උඩ බැලූ මට කිසිම සතෙක් සිටින බවක් දක්නට නොලැබුනි. සුළඟක්ද ඇත්තේම නැත. වටපිට බලනවිට දුරින් පෙනුන ජලාශයද පෙනෙන තෙක් මානයේ නොවීය. එහා මෙහා ඇවිද බැලුවත් ජලාශය පිළිබඳ කිසිම හෝඩුවාවක් ගත නොහැකි විය. එබැවින් මට තරමක චකිතයක් ඇතිවිය. මෙහි ගෝනුන් සහ වල්ඌරන් හැර වෙනත් වන සතුන් නැතිබව දැන සිටි බැවින් එතරම් බියක් ඇති නොවිය.

මෙහිදී මා අතරමං වූ බවට කෙරෙන අනතුරු ඇඟවීමක් ලෙස රුස්ස ගහේ අත්ත කඩා වැටීම, මාගේ පෙර පුණ්‍යකර්ම විපාකයක් බව මාගේ හැඟීමයි. එම සිදුවීම සඳහා වෙනත් කිසිම සාධාරණ හේතුවක් මට නම් නොතේරේ. එය සිදුනුනා නම් අතරමං වූ බව මට දැනගන්නට ලැබෙන්නේ බොහෝ ප්‍රමාදවූ පසුවය.

මා කොකළ වරදක් නිසා සිදුවූ වැරදීම

මා ගුවන් ගමන් පාලක තනතුරේ වැඩ කරනවිට ඇති වූ සිද්ධියක් මෙහිලා සඳහන් කිරීම උචිත යයි මට හැඟී යයි. අදට (අද 2022 දෙසැ.27) වසර 23කට පමණ පෙර, එනම් වර්ෂ 1999 දී පමණ දිනක් රාත්‍රි වැඩ මුරයේදී අළුයම දෙකට පමණ ඇතිවූ සිද්ධියකි. මෙහි දැක්වෙන රූපසටහනින් පෙනෙන්නේ අදාල ගුවන් මාර්ග දෙකක් වන A330 සහ G465 වේ. ඒවා ඡේදනය වන ස්ථානය DUGOS නමින් හැඳින්වේ. එම මාර්ග



දෙකෙහි ගුවන් යානා දෙකක් පියාසර කරමින් තිබුනි. A330 මාර්ගයේ බටහිර දෙසට ගමන් කළ යානය අඩි 35000 ක් ඉහළින් පියාසරමින් DUGOS වෙත ළඟා වෙමින් සිටි අතරතුර කටුනායකින් පිටත්ව බැංකොක් බලා පියාසර කරන යානය මඩකලපුව පෙදෙසට ළඟා වෙමින් සිටි අතර අඩි 37000 ක් දක්වා ඉහළ නැගීමට අවසර පැතීය. සෑම ගුවන් ගමන් මාර්ගයකම Reporting points නමින් හඳුන්වන ස්ථාන ගණනාවක් ඇති අතර ඒ සෑම ස්ථානයක් හරහාම පියාසර කරන එක් එක් යානාවේ අත්‍යවශ්‍ය තොරතුරු කීපයක් සඳහන්, විශේෂිත ආකාරයේ කඩදාසි පටියක්, ප්ලාස්ටික් වලින් සාදා ඇති strip holder එකක රඳවා අප ඉදිරියේ ඇති පුවරුවක රඳවා ඇත. A330 මාර්ගයේ පියාසර කරන යානයට අදාල විස්තර සහිත පටිය එතැනින් ගිලිහී බිම වැටී තිබුන අතර ඒ බව නුදුටු මගේ මතකයෙන්ද එය ගිලිහී තිබුනි. මා DUGOS නමැති ස්ථානය දෙස බලා, වෙනත් යානාවක් නැතැයි යන වැරදි අවබෝධය නිසාවෙන්, බැංකොක් බලා යන යානයට අඩි 37000 කට නැගීමට අවසර දුනිමි. සුළු

මොහොතකට පසු, A330 මාර්ගයේ බටහිර දෙසට පියාසර කරන යානය DUGOS පසුකරමින් සිටින බව පවසමින් එයට අඩි 500ක් පහළින් තවත් යානාවක් ඇති බවට අනතුරු සංඥාවක් TCAS (Traffic Collision Avoiding System) පද්ධතිය මගින් පෙන්නුම්කරන බව පැවසීය. සැනෙකින් සැබෑ තත්වය අවබෝධකරගත් මගේ ඉහමොල රත්විය. ජීවිතයේ පළමු වරට මගේ හද ගැස්ම වැඩිවුවත් සිදුවෙන්නගිය භයානක අනතුර වැලකී ගියෙන් මගේ මනස යථා තත්වයට පත්විය. යම් ලෙසකින් ගුවන් යානා දෙක ගැටුනේ නම් මොහොතකින් ජීවිත පන්සිය ගණනක් විනාශවන්නට ඉඩ තිබුනි. වසර විසිපහක පමණ මාගේ ගුවන්ගමන්පාලක රජකාරි කාලය තුල සිදුවූ පළමු අතපසුවීම මෙම සිද්ධියයි.

නමුත් මාගේ බිය මුළුමනින්ම පහව ගියේ දින ගණනාවකට පසුවය. ඊට හේතුව ගුවන් යානා දෙකේම නියමුවන් මට විරුද්ධව පැමිණිලි නොකිරීමයි. එය බලධාරින්ට පැමිණිලි කළේනම් මට පමණක් නොව ඒ වනවිට තම නිවස තුල සුව නින්දේ පසුවූ ප්‍රධාන ගුවන් ගමන් පාලක, රංජිත් සිල්වා මහතාටද දඬුවම් විඳීමට සිදුවනු ඒකාන්තයි. ඔහු කළ වරද වනුයේ වයස අවුරුදු පනහ ඉක්මවූ නිලධාරියෙක් ක්‍රියාකාරී සේවයේ යෙදවීමයි. ඒ වනවිට මගේ වයස අවුරුදු 55ක් පමණ විය. ඒ මොහොතේම මා ක්‍රියාකාරී ගුවන් ගමන් පාලක තනතුරෙන් ඉවත්ව, සිවිල් ගුවන් සේවා ආයතනයේ උපදේශක තනතුරක් භාරගෙන වයස 60 දී විශ්‍රාම ගතිමි.

මේ පිළිබඳව තවත් අපූරු තොරතුරක් ලැබුනේ මෙය සිදුවී වසර 23කට පමණ පසුව, එනම් 2023 ජනවාරි 3 වැනිදාය. ඒ, දැනට විදේශගතව සිටින මා සමග එදා ඒ මොහොතේ සේවය කරනලද ගුවන්ගමන් පාලකවරයෙක්ගෙනි. ඔහු කියාසිටියේ, එම සිද්ධිය වී පැය කීපයකට පසුව උදෑසන, ප්‍රධාන ගුවන්ගමන් පාලක රංජිත් සිල්වා මහතා විසින් සිද්ධියට අදාල හඬපට නැවත ශ්‍රවනය කිරීමට උත්සාහ කර ඇතත් එය නිශ්ඵලවූ බවය. ඊට හේතුව එම පටිගත කිරීමේ යන්ත්‍රය, එම සිද්ධියට සුළු මොහොතකට පෙර සිට අක්‍රියව පැවතීමය. සාමාන්‍යයෙන් ගුවන් යානා සමග කරන සංවාද, විවිධ අංශ සමග කෙරෙන සංවාද (*intercom system)* ආදී සියල්ලම සෑම මොහොතකම ස්වයංක්‍රියවම පටිගත වන අතර, සෑම උදෑසනකම එම පටි මාරුකර මාසයක පමණ කාලයක් සුරක්ෂිතව තබාගනු ලැබේ. එම පටියෙහි *audio channels* දහඅටක් පමණ තිබූ බව මට මතකය. එකල ඒවා එලෙස සිදුකළත් අද ඉතා දියුණු ක්‍රම අනුගමනය කරන බැවින් එවැනි දෝශ සිදු නොවන බව අනුමාන කළහැකිය.

මෙහිදී මට විරුද්ධව කිසිම පැමිණිල්ලක් නොවූයේ මා විසින් පෙර භවයකදී කරනලද පුණ්‍ය කර්මයක ප්‍රතිඵලයක් බව මම විශ්වාස කරමි.

ප්‍රබලතම කර්ම විපාකය

අපගේ විවාහයෙන් වසර ගණනකට පමණ පසු, මගේ භාර්යාව-කුසුම් මා ගැන වැරදි හැඟීමක් ඇතිකරගැණීම හේතුකොටගෙන වසර හතලිස් පහක් පමණ මා හට අප්‍රමාණ දුක්-ගැහැට, නින්දා, අපහාස විඳින්නට සිදුවිය. මෙය මා විසින් පෙර භවයකදී කරනලද යම් පාපකර්මයක් හේතුකොටගෙන සිදුවී ඇති බව මා තරයේ විශ්වාස කරමි. මේ පිළිබඳව ලියූ පිටු 27කින් සමන්විත **"ලෝකාන්තයෙන් එහා අන්තය"** නමැති කෘතියෙහි සවිස්තරාත්මකව දක්වා

ඇත. එකල මාගේ ඥාතීන් සහ මිතුරන් ගණනාවක්ම මට කියාසිටියේ දික්කසාද වෙන ලෙසය. නමුත් හේතු දෙකක් මත එම අදහස එකහෙලාම ප්‍රතික්ෂේප කළෙමි. එනම්

1. එවැන්නක් සිදුවුවහොත් දරු තිදෙනගේ මානසික තත්වය අවුල් වී ඔවුන්ගේ අනාගතය අඳුරු වනු ඒකාන්තයි.
2. මෙය මාගේ කර්ම විපාකයක් බව මා තරයේ විශ්වාස කරන අතර එය විඳදරාගෙන මා විසින් ගෙවාදැමිය යුතුයි.

සෑම අවස්ථාවකම මා කල්පනා කළේ මෙතෙක් කල් මට විඳ දරාගතහැකි වුනා නම් තව ටික කලක් එලෙසම ගතකිරීම අපහසු නොවන බවයි. මේ අයුරු වසර හතලිස් ගණනක් ගතවූ පසු දිනක් ඇය මාළඟටම තේ එකක් රැගෙනවිත් "විජේ තේ එකක් හැදුව බොන්න" යයි කී විට, මොකද්ද මේ සිද්ධවුනේ යයි මට පුදුම හිතුනි. පසුගිය වසර හතලිස් ගණනක් තුල මෙවැන්නක් සිදුවී නැත. සමහරවිට ඇයට සත්‍ය අවබෝධ වී ඇත. 2019 සිට අද (2024) දක්වාම මේ තත්වය පවතී. අද සමහර අවස්ථාවල මට තේ එක හදාගෙන ඇවිත් එය පානයකර අවසන්වනතෙක් රැඳීසිට හිස් කෝප්පයද රැගෙන ගොස් සෝදා තබනු ලබයි.

ඉන් මා නිගමනය කළේ, මෙම කර්ම විපාකය මා විසින් ගෙවා අවසන් කරඇති බවයි. මීළඟ භවයට ගෙනයාමට කිසිත් ඉතුරුවී නැත යන්න මගේ හැඟීමයි.

මේ පිළිබඳව තවත් කරුනක් කිවයුතුයි. දීර්ඝ කාලයක් තිස්සේ බලවත් මානසික පීඩනයකට යටත්ව ජීවත්වීම හේතුකොටගෙන විශාදය හෙවත් depression *නමැති මානසික රෝගය වැළඳෙන බව මා අසා ඇත. එය සත්‍ය නම් මට එවැන්නක් සිදුනොවීමත් පෙර කරනලද පුණ්‍ය කර්ම විපාකයක් වියහැකිය.*

<u>අනූනමයෙන් බේරීමේ පාපකර්මය</u>

රෝගී තත්වයක් නිසා පුතා විසින් 2023 ජනවාරි 8වැනිදා මාව කොළඹ "ලංකා හොස්පිට්ල්" රෝහලට ඇතුලත් කරන ලදී. 10වැනිදා හවස් වරුවේ මා තරමක අසාධ්‍ය තත්වයකට පත්විය. මිනිත්තු කීපයක්ම එම තත්වය පැවතුනි. මට කථාකිරීම අපහසු විය. අත සෙලවීම පවා ඉතා අපහසු විය. මේ ගතවන්නේ මගේ අවසාන මෙහොත යයි මට හැඟුනි. සියල්ලන්ම හැරදා යාම පිළිබඳව යම් දුකක් ඇතිවීම හේතුකොටගෙන දෑස් කඳුලින් තෙත්වූ නමුත් අනිත්‍යතාව අවබෝධකරගෙන සිටින මා හට එය ගැටළුවක් නොවීය. තිලිණි-දුව මාගේ වම්පසින්ද, පොඩිඅක්කා දකුණු පසින්ද, හිස පිරිමදිමින් සිටි අතර, මිනිත්තු කීපයකට පසු සියල්ල යථා තත්වයට පත්විය.

මෙම සිද්ධිය අනූනමයෙන් බේරීමක් ලෙස මට හැඟීයන්නේ නැත. මගේ එකම අභිලාෂය හැකි ඉක්මනින් මේ ජීවිතයෙන් සමු ගැණීමයි. ඒ අනුව මෙය මාගේ යම් පාපකර්මයක් හේතුවෙන් සිදුවූවා යයි මට හැඟේ.

<u>අනූනමයයි දශම නමයයි නමයෙන් බේරීම</u>

<u>අකුණකින් ගැලවීම</u>

අද 2023 මාර්තු 23 වැනිදා:- අද දහවල් 10.15ට පමණ ඉතා ප්‍රබල අකුණක් පිපිරුනි. තරමක වර්ශාවක් සමගම, ළඟ ළඟම අකුණු සැර දක්නට ලැබුන නිසා මම වැඩ කරමින් සිටි

ලැප්ටොප් පරිඝනකය නිවා දමා විදුලි පේනුවද ගලවා දමා, vhf උපකරණයේ ඇන්ටෙනාවද ගලවා දමා රූපවාහිණියේ සහ ශීතකරණයේද විදුලිය විසන්ධිකළ සැනෙකින්, පෙරටත් වඩා ප්‍රබල තවත් අකුණක් පිපිරුනි. එය ඉතාමත් ළඟින් සිදුවූ බැවින් මා වැඩකරමින් සිටි කාමරයට පැමිණ පරීක්ෂා කරනවිට කාමරයතුල දුමක් දක්නට ලැබුනි. එවිටම දක්නට ලැබුනේ මා වාඩිවී සිටි තැනම බිත්තියේ සෙ.මී.15x15 ප්‍රමාණයේ සෙ මී 5ක් පමණ ගැඹුරති කැබැල්ලක් කැඩී විසිවී ඇති බවය. මා එතැන සිටියේ නම් අනිවාර්යයෙන්ම එය මාගේ අවසානය වනු ඒකාන්තය. ඇන්ටෙනාව ගැලවූ පසු එම කේබලයේ කෙළවර තිබුනේ එම ස්ථානයේ බිත්තියේ ස්පර්ශ වෙමිනි.

අකුණ නිසා වෝල්ට් ලක්ෂ ගණනක විද්‍යුත් විභවයක් එහි පවතින්නට ඇත. එමගින් අතිප්‍රබල විදුලි පුළිඟුවක් පැනීම නිසා පිපිරීමක් සිදුවූ බව අනුමාන කළ හැකිය. ඉහත වම්පස ඡායාරූපයෙහි දැක්වෙන්නේ බිත්තියට හානි වූ ආකාරයයි. එහි ඇන්ටෙනා කේබලයද පැහැදිලිව පෙනෙන්නට ඇත. මා සාමාන්‍යයෙන් මේසය අසල වාඩිවන ආකාරය දකුණුපස ඡායාරූපයෙන් දැක්වේ. තවත් විදුලි උපකරණ ගණනාවකටම හානි සිදුවී තිබින.

මෙම අවස්ථාවේ මගේ ජීවිතය ගැලවුනේ පෙර කරනලද පුන්‍ය කර්මයක් හේතුකොටගෙන බව මා විශ්වාස කරමි.

<u>හෘද ස්පන්ධනය වැඩිවීම</u>

2023 අගෝස්තු මාසයේ දිනක් කොළඹ "ලංකා රෝහල" වෙත තිලිනි දුව සමග ගියේ වෛද්‍යවරයෙක් හමුවීම සඳහාය. එහිදී හදිසියේම මාගේ හෘද ස්පන්ධනය මිනිත්තුවට 200 ඉක්මවා ගිය බව දැනුනෙන් ඔරලෝසුව දෙස බලාගෙන ගනන්කළ නමුත් ගනන්කිරීමට බැරිතරම් වේගයෙන් හදගැස්ම සිදුවිය. එය දැනගත් තිලිනි විසින් මාව හදිසි ප්‍රතිකාර අංශයට ඇතුලත් කර ප්‍රතිකාර කරමින් පැය දෙකකට පමණ පසුව සාමාන්‍ය තත්වයට පත්විය. අතරමගදී මෙය සිදුවූයේ නම් සමහරවිට එය මගේ අවසානය වීමට ඉඩ තිබුනි.

මීට වසර 25 කට පමණ පෙර දිනක් මා රිය පදවනවිට මෙවැන්නක් සිදුවූ අතර, අයින්කර නතරකර මිනිත්තු 15 කට පසු යථා තත්වයට පත්විය.

සුනඛයින් සම්බන්ධ කර්ම

සුනඛයින් සම්බන්ධ සිද්ධීන් කීපයක් ගෙනහැර දැක්වීම සුදුසු යයි මම සිතමි. පළමු සිද්ධිය 1990 දශකයේ පමණ සිදුවූවකි. එකල අප නිවසෙහි ලැසී නම් බැල්ලක් විසුවාය. එබැවින් නිතර නිතර වෙනත් බල්ලන් ගැවසුනි. දිනක් මම බල්ලෙකුට ගලකින් ගැසූවිට එය ගහක වැදී ආපසු පැමිණ මගේ ඇඟේම වැදුනි. තුවාලයක් සිදු නොවීය.

දෙවැනි සිද්ධියද, ඒ කාලයේම සිදුවූවකි. මිදුලේ සිටි බල්ලෙකු එලවීම සඳහා ලී කැබැල්ලක් රැගෙන පසුපස එලවනවිට පයපැටලී වැටීම නිසා සුළු තුවාල සිදුවිය.

තෙවැන්නද එවැනිම එකකි. අඳුර වැටන පසු මිදුලේ සිටි බල්ලෙකු පසුපස දුවනවිට කටුකම්බි වැටේ ගැටීම නිසා නළල තුවාල විය.

හතරවැන්න ඊයේ (2023 අගෝස්තු 23) සිදුවිය. අප නිවසට මෑතකදී බැල්ලක් එක්විය. ඌ පාරේ ගැවසුන දඩාවතේ යන එකෙකුය. පුතාගේ මෝටර්රථය නිවස දෙසට හරවනවිට උගේ කකුලක් යටවීම නිසා වෛද්‍ය ප්‍රතිකාර කර අප නිවසටම ගතිමු. “සේව්” යනුවෙන නම් තැබීය. ඌ සෙරෙප්පු කීපයක්ම කාදැමීය. සෙරෙප්පුවක් කනබව දුටු මම, කෝටුවක් ගෙන පසුපස එළවනවිට මාව මිදුළේ ඇදවැටී දනහිස් දෙක සහ අතක් සුළු වශයෙන් තුවාල විය.

WhatsApp Video
2023-08-26 at 01.03.

මින්පසු නම් බල්ලන් පසුපස එලවීම නොකරන්නට අදිටන් කරගතිමි.

2023 ජූනි 14 වැනිදා:-

ඉහත දැක්වූ සෑම අවස්ථාවකදීම මා ගැලවී ඇත්තේ මා විසින් පෙර භවයන්හි සහ මේ ජීවිතයේදීත් කරන ලද පුන්‍ය කර්මවල විපාක වශයෙන් බව මට නම් ඉතා පැහැදිලියි. ඒ අනුව මට එක්තරා අනාවැකියක් පලකළහැකිය. එය නිවැරදිදැයි මට දැනගත නොහැකි වුවත්, සමහරවිට මෙය කියවන ඔබට දැනගතහැකි වේවි.

එම අනාවැකිය මාගේ අභාවය පිළිබඳවයි. මට කිසිම දුකක් නොවිඳ මාගේ අවසන් මොහොතට මුහුනදිය හැකිය යනු එම අනාවැකියයි. එය කිසියම් දිනක සත්‍යවේදැයි සොයාබැලීම ඔබට භාරයි.

ඉහත සිද්ධීන් ඇතුළු මාගේ අත්දැකීම් සමූහයක් කියවීම සඳහා අන්තර්ජාලයේ පහත දැක්වෙන වෙබ් අඩවියට පිවිසෙන්න.
www.qsl.net/4s7vj
www.qsl.net/4s7vj/download/punchi
www.qsl.net/4s7vj/download/Personal/Exper

අවසන් වරට යාවත්කාලීන කරන ලද්දේ 2024 පෙබරවාරි 6 වැනිදාය.